ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

# ප්‍රසම්පාදන නිවේදනයයි

## Firewall සහ Analyzer සැපයීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම

**ලංසු අංකය: PR/02/12-57**

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින්, Firewall සහ Analyzer සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

ලංසු තැබීමේ ක්‍රියාවලිය ජාතික තරඟකාරී ලංසු තැබීමේ (NCB) ක්‍රියා පටිපාටිය යටතේ සිදු කරනු ලබන අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (GOSL) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල දක්වා ඇති සහ ලංසු ලේඛනවල සඳහන් සුදුසුකම් සපුරාලන සියලුම සුදුසුකම් ලත් ලංසුකරුවන් සඳහා මෙය විවෘත වේ.

උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන්ට මේ පිළිබඳ වැඩිදුර තොරතුරු බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,. නො. 234, 2 වන මහල, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, කළමනාකරු (ප්‍රසම්පාදන), දුරකථන: 011–2880550 / විද්‍යුත් තැපැල: mgr_procurement@slbfe.lk වෙතින් ලබාගත හැක.

ලංසු ලේඛන 2026.06.17 සිට 2026.07.08 දක්වා වැඩකරන දිනවල කාර්යාල වේලාවන් තුළ ඉහත ලිපිනයෙන් නොමිලේ පරීක්ෂා කළ හැකිය.

ආපසු නොගෙවන ගාස්තුව රු. 5,000.00 ක් මුදල් අයකැමි වෙත ගෙවීමෙන් අනතුරුව ලංසුකරුගේ නිල ලිපි ශීර්ෂය මත කරන ලද ලිඛිත ඉල්ලීමක්, ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් සමඟ ඉදිරිපත් කිරීමෙන් 2026.06.17 සිට 2026.07.08 දක්වා පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර කාලය තුළ SLBFE , ප්‍රසම්පාදන අංශය වෙතින් ලංසු ලේඛන ලබාගත හැකිය

ලංසුකරු විසින් ලංසුව සමඟ රුපියල් 200,000.00 ක අගයකින් යුත් ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු අතර, එය ලංසු විවෘත කරන දින සිට දින 105 ක කාලයක් (2026.07.09 – 2026.10.23) වලංගු විය යුතු අතර ලංසු ලේඛනය සමඟ අමුණා තිබිය යුතුය.

තෝරාගනු ලබන ලංසුකරු/ලංසුකරුවන් විසින් පිළිගැනීමේ ලිපිය නිකුත් කළ දින සිට දින 14 ක් ඇතුළත සමස්ත ලංසු වටිනාකමෙන් 10% කට සමාන කාර්යසාධන ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. එය පිළිගැනීමේ ලිපිය නිකුත් කළ දින සිට දින 393 ක කාලයක් සඳහා වලංගු විය යුතුය. ටෙන්ඩරය ප්‍රදානය කිරීමෙන් පසු සේවාව සැපයීමට ඔබ අපොහොසත් වුවහොත්, පූර්ව දැනුම්දීමකින් තොරව කාර්යසාධන ඇපකරය සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් මුදල් කරගනු ලබනවා ඇත.

ලංසු ඇපකරය සහ කාර්යසාධන ඇපකරය කොන්දේසි විරහිත, ඉල්ලුම් කළ සැනින් ගෙවිය හැකි ඇපකර ආකාරයෙන් තිබිය යුතුය. එම ඇපකර ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයා වෙත ගෙවිය හැකි පරිදි නිකුත් කරන ලද පිළිගත හැකි බැංකු ඇපකර ආකාරයෙන් ඉදිරිපත් කළ යුතුය..

ලංසු අඩංගු මුද්‍රා, තැබූ කවරවල ඉහළ වම් කෙළවරේ "Supply, Installation, Commissioning & Maintenance of a Firewall and an Analyzer - PR/02/12-57" ලෙස පැහැදිලිව සටහන් කළ යුතුය.

ලංසු 2026.07.09 දින පෙ.ව. 11.00 හෝ ඊට පෙර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2 වන මහලේ, ප්‍රසම්පාදන අංශයේ තබා ඇති අංක 01 ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගන්නා කාලය අවසන් වූ වහාම එම ස්ථානයේදීම විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැකිය.

කිසිදු හේතුවක් දැක්වීමකින් තොරව ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට අයිතිය ඇති අතර, ලංසු ලේඛනයක් සකස් කිරීම හෝ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රව දරන ලද කිසිදු වියදමක් ආපසු ගෙවීමට බැඳී නොසිටී.

**සභාපති**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**නො. 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**

**දුරකථන / ෆැක්ස්: 011-2880550 / 2880564 / 2887585**
**විද්‍යුත් තැපෑල :** mgr_procurement@slbfe.lk

**එතෙර සවියට මෙතෙර අත්වැල**